# පුස්තකාල ප්‍රවෘත්ති

පටුන

155497


* ලංකා ජාතික පුස්තකාලය 1 - 3

* පොත් පුවත් 4, 10, 12

* පැරණි පොත් ගුල් 5 - 9

* මණ්ඩලීය පුවත් - 11

* දෙහිවල - ගල්කිස්ස
මහජන පුස්තකාල ප්‍රණාලිය 13 - 18


5 වන කලාපය - අංක : 4 1977 ඔක්තෝම්බර්/දෙසැම්බර්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

"පුස්තකාල ප්‍රවෘත්ති"

5 වන කලාපය – අංක : 4
1977 ඔක්තෝම්බර්/දෙසැම්බර්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
ත්‍රෛමාසික ප්‍රකාශනය

සංස්කරණය හා ප්‍රකාශනය:

පුස්තකාල අධ්‍යාපන අංශය,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

සියළුම ලිපි හා විමසීම්:

සහකාර අධ්‍යක්ෂ (පුස්තකාල අධ්‍යාපන),
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
72, බෞද්ධාලෝක මාවත, කොළඹ-04.
දුරකථනය : 86990.

මෙහි පළ වන අදහස් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම අදාල ලේඛකයින් වෙත පැවරේ.

**පාඨකයන්ගෙන් ඉල්ලීමක්:** "පුස්තකාල ප්‍රවෘත්ති" සඟරාවේ පළ කිරීම සඳහා සුදුසුදැයි සලකා බැලීම පිණිස ප්‍රවෘත්ති, ලිපි–ලේඛන විශේෂාංග එවන ලෙස ආරාධනය කරනු ලැබේ; අදාල ක්ෂේත්‍රයන් පිළිබඳ පොතපත, සඟරා, පත්‍රිකා විචාරය සඳහාද එවිය හැකිය. අවකාශ ඇති පරිද්දෙන් මේවා පළ කෙරෙනු ඇත.

පළ නොවන ලිපි ආපසු ගෙන්වා ගැනීම සඳහා ලිපිනය සහිත මුද්දර ගැසූ ලියුම් කවරයක් එවිය යුතුය.

–සංස්කාරක

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
සඳහා
පොත් රැස් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පොත් එකතු කිරීම ආරම්භ කළ බව සතුටින් නිවේදනය කරනු ලැබේ.

තෑගි වශයෙන් හෝ වෙනත් අයුරකින් ශ්‍රී ලංකාවේ භාෂා, ශාස්ත්‍ර, විද්‍යා, ඉතිහාස යනාදී විෂයයන්ට අදාල පොත්පත් ලබා ගැනීමට ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට උපකාරී වන ලෙස ශාස්ත්‍රාභිලාෂී සියලු දෙනාගෙන්ම කරුණාවෙන් ඉල්වා සිටිමි.

සභාපති
ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලය

72, බෞද්ධාලෝක මාවත
කොළඹ 4.

"ලංකා ජාතික පුස්තකාලය"

(මයිකල් ග්‍රේත් - පුස්තකාල ගොඩනැගිලි පිළිබඳ යුනෙස්කෝ විශේෂඥ)

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අංශයක් වන අධ්‍යාපන, විද්‍යාව සහ සංස්කෘතිය සම්බන්ධව කටයුතු කරන පැරිසියේ යුනෙස්කෝව, ලංකාවේ ජාතික පුස්තකාලය සැලසුම් කිරීමේ කටයුතුවලට උපදෙස් දීමට ලංකාවට පැමිණීමට කැමතිදැයි මගෙන් විමසූ විට මම එක විටම එයට එකඟ වූයෙමි. වසර ගණනාවක් මෙහි වාසය කිරීමෙන් දිවයින පිළිබඳව මා තුළ තිබූ සුහද හැඟීම්, එක විටම එයට එකඟ වීමට බලපෑ පෞද්ගලික හේතුවූ අතර, මෙය ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් ලෙස මා තුළ කාලයක් තිස්සේ බලපැවැත්වූ හැඟීම්ද, ඒ සඳහා බල පෑ තවත් කරුණක් ලෙස දැක්විය හැකිය.

කොළඹ ගමන ගැන සඳහන් කළ විට, මගේ මිත්‍රයින් ඒ පිළිබඳව ප්‍රශ්න රාශියක් නැගීම මගේ විත්තියට හේතු වූ කරුණක් වූ බව සඳහන් කළ යුතුය. ලංකාවට පැමිණි පසුවත් ඒ හා සමාන ප්‍රශ්න මගෙන් විමසන ලදී. විවිධ ප්‍රදේශවල පැන නැගුණත්, ප්‍රශ්න කෙරෙහි ඇති ආකල්පය එතරම් විවිධ නොවන බව මම විශ්වාස කරමි. එමම ප්‍රශ්න කුමන ඒවාදැයි දැක්වීමටත්, ඒ සඳහා මගේ පිළිතුරු ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීමටත්, ඔබ දැන් මට අවස්ථාව ලබා දිය යුතුයි.

සම්පූර්ණයෙන්ම අනපේක්ෂිත නොවූ පළමු ප්‍රශ්නය නම් ඇත්ත වශයෙන්ම ජාතික පුස්තකාලයක අවශ්‍යතාවයක් තිබේද යන්නයි. විශේෂයෙන්ම බැරෑරුම් ප්‍රශ්න රාශියකටම මුහුණ පා සිටින, සංවර්ධනය වන රටකට එහි ඇති අවශ්‍යතාවය විමසුමට භාජනය වූ ප්‍රධාන ප්‍රශ්නයක් විය. මේ සඳහා මගේ පිළිතුර නම්, විශේෂයෙන්ම සංවර්ධනය වන රටකට ජාතික පුස්තකාලයක් අත්‍යවශ්‍ය බව යි. ඕනෑම යුගයක ~~විශේෂයෙන්ම වේගවත්~~ සමාජීය සහ ආර්ථික විපර්යාසයනුත් , ~~ඒ නිසාම සංස්කෘතික~~ විපර්යාසයනුත් ඇති වන වර්තමාන යුගයේ ~~ඉතිහාසය හා සංස්කෘතිය වාර්තාගත කොට~~ තබා, අනාගතය සඳහා ආරක්ෂා කර තැබීම ඉතාම වැදගත් දෙයක් වෙයි. මේ අන්දමට අප ක්‍රියා නොකළ හොත් අපි, අතීතය පමණක් නොව වර්තමානයද අතරමං කරනවා පමණක් නොව, අනාගතයේ ඇතිවන ජනතාවට තමන්ගේ ඉතිහාසය අවබෝධ කරගැනීමේ හැකියාවත්ද අහිමි කරවනු ලබයි. මට පෙනෙන ආකාරයට ඕනෑම රටක ආර්ථික ප්‍රශ්න කරම්ම වැදගත්වන මේ ප්‍රශ්නයේදී එයට සුළු අවධානයක් පමණක් යොමු කිරීම සාපරාධී වරදක් ලෙස සැලකිය යුතු දෙයකි. කිසිම රටක් ඇත්තවශයෙන්ම එහි ආර්ථික අංශය මත පමණක්ම රඳා නොසිටින බව අප අමතක නොකළ යුතු දෙයකි. මේ නිසා, විශේෂයෙන්ම සංස්කෘතික වශයෙන් ඉතාම දියුණු ලංකාව වැනි රටක, මෙවැනි ආයතන ඉක්මනින්ම පිහිටුවීම, අපි අපේ අනාගත ඉතිහාසය සඳහා වඩා විශාල මෙහෙයක් කිරීමක් වේ.

මෙම තේමාවෙහිම තරමක් වෙනස් ස්වරූපයකින් ඉදිරිපත් වන දෙවන ප්‍රශ්නය බොහෝ දුරට එක හා සමාන ස්වරූපයක් ගනු ලබයි. ඒ අනුව ජාතික පුස්තකාලයක් සංවර්ධනය වන රටකට අවශ්‍ය බව පිළිගත්තා නමුත්, මේ අවස්ථාවේ ඒ සඳහා දැරීමට සිදු වන අති විශාල වියදම්, ගොඩනැගිලි තැනීම සඳහා මෙන්ම ඒ සමඟ බැඳී පවතින කාර්ය සංවිධානය සඳහා දැරීමට සිදුවන මුදලත් ඇත්තවශයෙන්ම, වෙනත් අංශයක වඩා විශාල අවශ්‍යතාවයන් සඳහා නොයෙදවිය යුතුද යන්න මතුවේ. තැවතත් මේ පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩදෙනු මැනවි. මට පෙනෙන

ආකාරයට නම්, යමෙකු ආර්ථිකය ගැන කථා කරනුවා නම්, ඔහු සම්පූර්ණයෙන්ම මුදල් ගැන පමණක් කතා කරන බවයි. සරල වශයෙන් කියනවා නම් ඔහු 'දරිද්‍රතාවය' ගැන පමණක් කතා කරනු ලබයි. නමුත් මගේ අදහසේ හැටියට 'දරිද්‍රතාවය' යනු මුදල් පිළිබඳ කරුණක් පමණක් නොවන බව, සංවර්ධිත රටවල් සම්බන්ධයෙන් මෙන්ම සංවර්ධනය වන්නාවූ රටවල් සම්බන්ධයෙන්ද මීට කලකට පෙර අප සොයා ගන්නා ලද කරුණකි. එය සම්පත් පාලනය කිරීම පිළිබඳ කරුණක් වන අතර, සම්පත් ලෙස හැඳින්වෙන්නේ ආර්ථිකය හා මුදල් පමණක් නොව ඊට වඩා විශාල ක්ෂේත්‍රයෙකි. විසි වන සියවසේ පශ්චාත් භාගයේදී ප්‍රවෘත්ති විශාල සම්පතක් බවත්, එය මුදල් තරම්ම වැදගත් වත්කක් බවත් කවුරුත් දන්නා කරුණකි. එසේම එය මුල පටන්ම වැදගත් සම්පතක් ලෙස පැවතුණු බවත්, සඳහන් කිරීමට කැමැත්තෙමි. ඉන්ද්‍රජාලම් ගැන දන්නා සමාජයේ සිටින අයට අනික් අය පාලනය කිරීමටත්, සම්පත් බලය සහ මුදල් ලබාගැනීමටත් හැකියාවත් ලැබී තිබේ. වෙනත් සමාජයන්හි උගත්කම, පාලනය ලබා ගැනීමේ ප්‍රබල මාර්ගයක් වන අතර, තොරතුරු හොඳින් යොදා ගැනීමේ සාමාන්‍ය හැකියාව නිසාම ජන කොටස් සහ ජාතීන්ට පාලනය ලබා ගැනීමට හැකියාව ලැබී තිබේ. මෑතකදී සිදු වූ දෙයක් ගැන බලන විට නෞකා ශිල්පය, කොම්පාසුව සහ වෙඩි බෙහෙත් පිළිබඳව දැනගත් සමහර ජාතීන්ට විජිත ආධිපත්‍යයක්, ලෝකය පුරා අති විශාල ධන සම්පතක් අත්පත් කර ගත හැකිවීම දැක්වීමට පිළිවන. මම අදහස් කරන අන්දමට වර්තමානයේ දී අප මුහුණ පා සිටින තත්ත්වයක් මීට සමානය. මට ~~පෙනෙන~~ ආකාරයට අද අති විශාල තොරතුරු නිධානවලට ඇත්ත වශයෙන්ම සම්බන්ධකමක් පවත්වා නොගන්නා කිසිම ජාතියකට, මම මුලදී පෙන්නුම් කළ ~~ආකාරයට සංස්කෘතික~~ වශයෙන් පැවතීමට නොහැකි වනවා මෙන්ම, ආර්ථික ~~වශයෙන් පැවතීමට~~ද ඔනාහැකිව බලපෑම් සහගත තත්ත්වයෙන් ගිලිහී ගොස් ලෝකයේ, එයට අයිති ස්ථානයේ සිටීම නොහැකි තත්ත්වයක් උදා වේ.

පුස්තකාල පිළිබඳ සම්පූර්ණ සංකල්පයේම මීට සම්බන්ධ තවත් අංශයක් ඇතැයි මම සිතමි. ~~ශ්‍රී ලංකාවේ, ඇමෙරිකාව සහ ලෝකයේ තවත් ප්‍රදේශවල විශාල තොරතුරු ගබඩා වැනි වූ පුස්තකාල~~ තිබේ. ඔබට යම්කිසි තොරතුරක් දැනගැනීම අවශ්‍ය වූ විට මේවාට ගොස් පොත්, අත් පිටපත් නැතිනම් වෙනත් මාධ්‍යයක් ලබා ගැනීමට පුළුවන. වෙනත් අවස්ථාවල මෙම පුස්තකාල අධ්‍යක්ෂකය පිළිබඳ දැනුම, එක් රැස් කර ගෙන සිටින ස්ථානවලට වඩා තොරතුරු බෙදා හරින මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කිරීමත් දක්නට ලැබේ. ඒ අනුව තොරතුරු ශ්‍රී ලංකාවෙන් හෝ ලෝකයේ කුමන රටකින් ලැබුණත්, මේ රටේ සියළුම ජනතාවට ලබා ගැනීමට හැකි වෙන අතර, ඒ මගින් ජනතාවට ලෝකය වටා සිදුවන දෙවල් පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ඇතිව සිටිය හැකිවේ.

මගෙන් අසන ලද් වඩාත් සිත්ගන්නා සුළු තුන් වන ප්‍රශ්නය වනුයේ, විසිවන සියවසේ දෙවන භාගයේදී මුද්‍රිත අකුරුවලට වඩා වෙනත් මාධ්‍යයන්, වඩාත් ඉක්මනින් වෙනත් ප්‍රචාරක මාධ්‍යයන් තිබිය දී පොත් සහ පුස්තකාල අවශ්‍යද යන්නයි. මේ අනුව ශ්‍රී ලංකාවේ ටෙලිවිෂන් සේවාවක් ඇති කිරීමට හෝ නූතන විදුලි ප්‍රචාරන ක්‍රමය වඩා පුළුල් කිරීමට හෝ මුදල් යෙදවීම වඩා යෝග්‍ය නොවන්නේද යන්න පැන නගී. එම එක් අංශයක් සරල වුවත්, මේවාට ඇති පිළිතුරු තරමක් සංකීර්ණ යැයි සිතමි. ටෙලිවිෂන් සේවාවක් පිහිටුවීම ජාතික පුස්තකාලයක් පිහිටුවී[illegible]වාට වඩා ඉතා විශාල ලෙස වියදම් යන කාර්යයක් වන අතර, මේ අංශ දෙකට වැය වන මුදල් [illegible]ණය පිළිබඳව කිසිම ආකාරයක සැසඳීමක් කළ නොහැක. ඒ සමඟම වඩා වැදගත් මූලි කරුණක් වේ. එතෙකට වෙනස් මාධ්‍යයන් විවිධ කාර්යයන් ඉටු කරනු ලැබිය යුතුවෙයි. මුද්‍රිත ග්‍රන්ථයන් හෝ මුද්‍රණය කරන ලද ප්‍රචාරක ඇති විශාලම වාසි

සහගත කරුණක් වනුයේ එය පාඨකයාට ලබාගත හැකිවීමයි. අනාගතයේ ඕනෑම වර්ගයක පාඨකයෙකුට, ඔහුට එම තොරතුරු අවශ්‍ය යැයි තීරණය කරන ඕනෑම අවස්ථාවක ඒවා ලබා ගත හැකි වන අතර, එය නිරන්තරයෙන්ම එහි තිබේ. ඔහුට මූලාශ්‍රයන් පරීක්ෂා කළ හැක. ඒවා ආසන්න කාලයේදී තර්ක විතර්ක ආදිය සඳහා යොදා ගත හැක. ඒ අනුව මේවායේ තිබෙන්නේ මොනවාදැයි සොයා බලාගෙන, කලින් ඉදිරිපත් කරන ලද අදහස් විවේචනයට භාජනය කිරීම ඔහු සතු කාර්යයකි. කෙසේ වෙතත් මම ඉදිරිපත් කරන අදහස් වැදගත්ද, නොවැදගත්ද කියා තීරණය කිරීමේදී, මම දැන් ඉදිරිපත් කළ අදහසට එරෙහිව අදහස් ඉදිරිපත් කිරීම ඔබට ඉතාමත් අපහසු වනු ඇත. තොරතුරු සම්පත්, අප කිසිවකු නොදන්නා අනාගතය උදෙසා එකතුකොට තබා, ලබා දිය යුතු වීම, ඉතාම වැදගත් වන අතර සංවර්ධනය වන රටවල් සම්බන්ධයෙන් එහි වැදගත්කම ඉතාමත් වැඩිවේ. ඒවා යොදාගන්නේ කුමන ආකාරයටද, ඒවා සමඟ කුමක් කරනවාද යන්න අනාගතයේදී තීරණය කරනු ලබනු ඇත. මම ඉදිරිපත් කරලීමට උත්සාහ කළ අදහසට ඔබ දැන් එකඟ වනු ඇතැයි මම විශ්වාස කරමි.

ලංකා ජාතික පුස්තකාලය කොළඹ පිහිටුවන්නේ ඇයිද යන්න තවදුරටත් සාකච්ඡාවට භාජනය වන කරුණක් විය හැක. කෙසේ නමුත් සාකච්ඡා පැවතුනත්, 'ජාතික පුස්තකාලය' ගොඩ නැඟීම සාර්ථක අවසානයකට ළඟා වනු ඇතැයි මම විශ්වාස කරමි. ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙනුවෙන් මෙවැනි පුස්තකාලයක් සැලසුම් කරලීමෙනුත්, මෙහි සිටීමෙනුත් මම විශාල ප්‍රීතියක් සහ වින්දනයක් ලදිමි. නමුත් වැදගත් වන කරුණ නම්; මම ප්‍රීතියක් ලැබුවාද නැද්ද යන්න නොව, අවසානයේ මෙහි ගොඩනැගිල්ලක්, වඩාත් වැදගත් ලෙස තියනවා නම් දැනුම ගබඩා කරන සහ බෙදාහරින, ක්‍රියාත්මක ආයතනයක් බිහිවිය යුතු වීමයි. මේ හැම දෙයකටම වඩා වැදගත් වන දෙයු නම් වර්තමානයේ සහ අප කිසිවකු නොදන්නා ඈත අනාගතයේ මේ තොරතුරු නිරන්තරයෙන්ම සහ ප්‍රයෝජන වත් අන්දමට උපයෝගී කර ගන්නා ජනතාවක් සිටිය යුතු වීමයි.

(පරිවර්තනය යූ. අමරසිරි)

## සිංහල ශබ්ද කෝෂයේ වැඩ ඉක්මන්...!

සිංහල ශබ්ද කෝෂය ඉක්මන් කිරීම සඳහා බාහිර ලේඛකයන් විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ පෙරදිග භාෂා පිළිබඳ පඬිවරුන් බඳවාගෙන එහි සම්පාදන කටයුතු කරගෙන යාමට සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති ඊ.ඇල්.බී.හුරුල්ල මහතා තීරණය කර තිබේ.

මෙම නව ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙල යටතේ සිංහල ශබ්දකෝෂයේ කටයුතු අවුරුදු කිහිපයකින්ම අවසන් කිරීමට ක්‍රියා කරගෙන යන බව සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් තලින් රත්නායක මහතා ප්‍රකාශ කර ඇත.

නව ප්‍රතිසංවිධානය අනුව සිංහල ශබ්ද කෝෂයේ ප්‍රමාදයට ඇති සියලුම හේතු සොයා බලා අප්‍රමාදවම ඒ සියලුම අවශ්‍යතාවනයන් සම්පූර්ණ කිරීමට සංස්කෘතික අමාත්‍යාංශය පියවර ගනු ඇත.

අවශ්‍ය තරම් ලේඛකයන් ඇතුළු විවිධ අවශ්‍යතාවයන් නොතිබීමත්, විධිමත් සැලැස්මක් අනුව කටයුතු නොකිරීමත් නිසා අවුරුදු 50 ක් තරම් කාලයක් තිස්සේ සිංහල ශබ්දකෝෂයේ කටයුතු ප්‍රමාද වී ඇති බවද හෙළි වී ඇත.

1927 රාජකීය ආසියාතික සමිතිය මගින් ආරම්භ කරන ලද සිංහල ශබ්ද කෝෂය 1941 දී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට පවරන ලදුව, එතැන් සිට විශ්ව විද්‍යාලය මගින් පවත්වාගෙන එන ලදී. 1972 දී සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති සංස්කෘතික මණ්ඩලයට පවරන ලදුව, දැනට ශබ්ද කෝෂයේ කටයුතු සංස්කෘතික අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සංස්කෘතික මණ්ඩලය මගින් කරගෙන යනු ලැබේ.

~~සිංහල ශබ්දකෝෂයේ සිංහල — සිංහල කාණ්ඩයෙන් 'අ' යන්නෙහි සිට 'ආ' යන්නෙහි~~ අවසානය දක්වා පිටු 1192 ක් මේ දක්වා මුද්‍රණයෙන් නිකුත් කී ඇති අතර, 'ආ' යන්නේ මුල සිට එහි අවසානය දක්වා පිටු 192 කින් යුත් 22 වැනි කලාපය දැනට මුද්‍රණය අවසන් වී ඇත.

දැනට 'ක' යන්නෙන් එන ලිපි ලිවීමද, සංශෝධනය කිරීමද, බාහිර උපදේශකයන්ගේ අදහස් විමසීම ඇතුළු කටයුතු කරගෙන යනු ලැබේ.

(ශ්‍රී ලංකාදීප - 77.12.25)

# පැරණි පොත්ගුල්


ආචාර්ය
හොරණ වජිරඤාණ හිමිපාණන්
විසිනි.


ලේඛනය ආදී විවිධ කලාවන් බිහි වූයේ මිනිස් ශිෂ්ඨාචාර මාර්ගයට වැටීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මීලේච්ජ යුගයේ මිනිසුන්ට තිබුණු එකම අදහස ස්වකීය උදර පෝෂණය සඳහා යමක් සොයා ගැනුම පමණෙකි. ජීවිතය රසවත් කර ගැනීම පිණිස කලාව උපයෝගි කරගත්තේ ශිෂ්ඨත්වයට පත්වීමෙන් පසුවය.

කලාවත් - ශිෂ්ඨාචාරයත් අත්වැල් බැඳගෙන එන දෙදෙනෙකි. ශිෂ්ඨාචාරය ඇති වූයේ ආගම නිසාය. "ආගමක් නැතිව ශිෂ්ඨාචාරයක් දියුණු වී නැතැ" යි අපර දිග මහා කවියකු වන ටී.එස්.එලියට් ද කියයි. කලාවන් බිහිවීමේ මූලික අත්තිවාරම බැඳුණේ ආගම් නිසයි. අප රටේ පැරණි කලා - ශිල්ප විමසා බලන්නකුට මෙය මැනවින් වටහා ගත හැකිය.

ලේඛන කලාව නිසා පොත් පත් බිහිවිය. අපේ පැරණි මිනිසුන් හමුවීමට නම්, පොත් පත් මාර්ගයෙන් ඔවුන් වෙත යා යුතුය. ගුරු මුවින් අසා ඉගෙනීමට සීමා වී තිබුණු ආදි යුගයට වඩා පළල් ලෝකයකට ශිෂ්‍යයන් යොමු කරවීම පිණිස පොත පතින් සිදුවූ - සිදුවන මෙහෙය අපමණය. එකල ශිෂ්‍යයකුට සම්පූර්ණ අධ්‍යයනයක් ලබා ගැනීමට දැඩි වෙහෙසක් ගන්නට සිදුවිය. අවුරුදු ගණනක් ආචාර්යවරයාට අතවැසිකම් කළත්, අවසානයේ 'ගුරු මුෂ්ටිය' ලබා ගැනීම ඉතා අපහසුය. ඉතා භයානක දේ පවා කරන්නට සිදුවිය. ශාස්ත්‍රයට ඇති බලවත් ආසාව නිසා, ස්වකීය ජීවිතය ගැන පවා නොසලකා දුෂ්කර කාර්යයන්හි යෙදුණ ශිෂ්‍යයන් ගැන තොරතුරු බෞද්ධ කථා වස්තුවල හා වේද කතාවන්හි ඇතුලත් වී තිබේ.

## පුරාණ පුස්තකාල:

ලේඛන කලාවේ ව්‍යාප්තියට ප්‍රධාන හේතුව වූ කඩදාසි හා මුද්‍රණ ශිල්පය ඇතිවීමට පළමු ලෝකයේ නොයෙක් රටවල පුස්තකාල තිබුණු බව කෞතුක වස්තූන්ගෙන් අනාවරණය වේ. පෙරදිග මෙන්ම, අපරදිග රටවලද පුරාණ පුස්තකාල තිබිණි.

බැබිලෝනියාව ඇසිරියන්වරුන්ගේ පාලනයේ පැවති යුගයේ 'සර්දන පාලස්' නම් රජෙක් විය. රටේ විද්‍යා - කලා ශිල්ප දියුණුවට මහත් වැඩ කළ ඒ රජුගේ පුස්තකාලයත් පිළිබඳ තොරතුරු දැනට සොයාගෙන තිබේ.

ඉතා පුරාණයේ මිනිසුන් ලිවීම සඳහා භාවිත කළේ මැටි තහඩු වර්ගයකි. එසේ අකුරු ලියූ මැටි තහඩු වලින් යුත් පුස්තකාලයක් 'සර්දනපාලස්' රජ සමයේ කෞතුකවස්තු අතර දක්නට ලැබේ. මෑතකදී සොයා ගත් මේ 'මැටිතහඩු පොත්ගුල් ලෝකයේ ඉතා වැදගත් පුරා වස්තු ලෙස

විද්‍යාඥයෝ කල්පනා කරති. මේ මැටි තහඩු වල යුද්ධ නීති, රාජනීති, සාහිත්‍ය රචනා ආදියද ලියා තිබෙන බව කියනු ලැබේ.

චීනය, ඊජිප්තුව, ඇලෙක්සැන්ඩ්‍රියාව ආදි රටවලද මෙසේම සුප්‍රසිද්ධ පැරණි පුස්තකාල තිබුණු බව අනාවරණය වී ඇත. විශ්ව විද්‍යාල පුස්තකාලයන්ට නොදෙවැනි උසස් තත්ත්වයකින් මේ සමහර පුරාණ පුස්තකාල දියුණු වී තිබුණු බව කියති.

මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ පැතිරීමට මහත් මෙහෙයක් කළ මේ පුස්තකාල සමහරක් පොදු ජනයාගේ කියවීම සඳහා වෙන්වී පැවති බව සිතිය හැකිය.

ක්‍රිස්තු පූර්ව 3 වැනි ශත වර්ෂයේ පමණ රෝමයේ තිබුණ විශාල පුස්තකාලයක් ගැනද තොරතුරු සොයාගෙන ඇත. රෝම පුරවැසියන් තුළ පොත් එකතු කිරීම පිළිබඳ ආසාව ලියලවීමට අතිශයින් උපකාරී වූ මේ පුස්තකාලයේ පොත් විශාල සංඛ්‍යා වක් 'මාක් ඇන්ටනි' විසින් ක්ලියෝපැට්රාට' පරිත්‍යාග කළ බවත්, ඒනිසා මාක් ඇන්ටනිට විරුද්ධව පසුකලෙක චෝදනාවක් නඟා තිබුණ බවත් කියනු ලැබේ.

නාලන්දා පුස්තකාල

7 වැනි ශත වර්ෂයේ පමණ, මුළු ආසියාවේම කීර්තිය විහිදී ගිය දඹදිව නාලන්දා විශ්ව විද්‍යාලයේද ඉතා දියුණු පුස්තකාලයක් තිබුණු බව සඳහන් වේ.

නාලන්දාවේ 'රත්නෝදධි' නම් ඉතා වටිනා පුස්තකාලයක් තිබුණේය. එහි හීනයාන - මහායාන බෞද්ධ නිකාය දෙකටම අයත් පොත් විශාල සංඛ්‍යාවක් විය. එහෙත් ක්‍රි.ව.8 දී පමණ නාලන්දාවේ තරුණ භික්ෂූන් තීර්ථකයන්ට අවමන් කිරීමක් නිසා කෝපවූ තීර්ථකයෝ පොත් සියල්ලම ගිනි තබා විනාශ කළහ. 'හියුං සියුං' නාලන්දාවට පැමිණෙන විට (ක්‍රි.ව.7 ශ.ව.) පුස්තකාලයත හොඳින් තිබිණ.

පූජ්‍ය පූජක පක්ෂය

පෙර අපර දෙදිග හැම රටකම පාහේ පුරාණයේදී පූජ්‍ය - පූජක පක්ෂ ශිෂ්ටාචාරයේ සංවර්ධනයට අතිශයින් උපකාරී වූහ. රටේ උගත් පක්ෂය වූයේ ඔවුහුය. ඔවුන්ට රාජ බලයද සෑහෙන පමණ ලැබිණ. මේ නිසා ශිෂ්ටාචාරයේ මෙන්ම, ශාස්ත්‍රාලෝකය පැතිරීමේද මූලස්ථානය වූයේ ආගමික සිද්ධස්ථානයෝය. ඇතැම් අඳුරු යුගවලදී ඔවුහු සිය ජීවිතයද නොතකා ශාස්ත්‍රීය පොතපත රැක ගත්හ.. ලංකා ඉතිහාසයේ අඳුරු කාල පරිච්ඡේද ගැන තොරතුරු සොයා බැලීමේදී මෙය මැනවින් පැහැදිලි වේ.

සිංහල රජදරුවන් කල අපේ භාෂා සාහිත්‍ය පෝෂණය වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේ නිසාය යනු අද කවුරුනුත් අවිවාදයෙන් පිළිගන්නා කරුණෙකි. නිදහස් ජීවිතයක් ගත කළ භික්ෂූන් වහන්සේ ස්වකීය ජීවිතය, ස්වකීය ආගමටත්, භාෂා සාහිත්‍ය පෝෂණයටත්, සමාජ සේවය වත් කැපකළහ. රජවරු ඊට උපකාරකළහ. මේනිසා සෑම විහාරස්ථානයකම පාහේ පිරිවෙන් නමින් විද්‍යාස්ථාන ආරම්භ විය. පුස්තකාලද පැවැත්වේය. එකල ගම්බද ජනයාමෙන්ම නගරබද

ජනයාද අළුත් දේ දැනගැනීමටත්, උපදෙස් ගැනීමටත්, සාකච්ඡා පැවැත්වීමටත්, නිතර දෙවේලේ රැස්වූයේ ගමේ විහාරස්ථානයටය. එහෙයින් විහාරස්ථානය සාමාන්‍ය ජනයාගේ බුද්ධි වර්ධනය සඳහා ඉවහල් වන පොත් පත් කියවීමෙන් හා පුස්තකාල වලින්ද යුක්ත වූ බව සිතිය හැකිය.

පැවිදි තැන් අයිති පොත්පත් පිරිකරාදී සියල්ල ගිහිවීමෙන්ද, කාලක්‍රියා කිරීමෙන්ද පසු සංඝ සන්තක වන බැවින් සිවුරු හැර ගිහි භාවයට පැමිණෙන තැන් විසින් පැවිදිව සිට ලත් දෙයින් කිසිවක් ගෙන නොයා යුතුයි" යැයි රාජ කතිකාවතෙහි එන පාඨයෙකි. මේ භික්ෂූන් සතු පොතපත පොදු යහපත සඳහා යෙදවිය යුතු බව මෙයින් වටහා ගත හැකිය. එම පොත් පොදුවේ ප්‍රයෝජනය ගත හැකි පරිදි පුස්තකාල ආදියෙහි තැන්පත් කරන්නට ඇතැයි සිතන්නට පුළුවන.

පෙර ලක්දිව ප්‍රධාන විද්‍යාස්ථානය වශයෙන් පැවතුණේ පිරිවෙන්ය. 'මහා වංශ' ආදී ඉතිහාස පොත්වල එකල පැවති පිරිවෙන් ඉතා උසස් තත්ත්වයේ විද්‍යාස්ථාන බවට ප්‍රකාශවෙයි. මේ හැම පිරිවෙනකම පොත්පත් ලිවීමට විශේෂ පහසුකම් සලසා තිබිණ. අනුරාධපුර මහා විහාර පිරිවෙන් පුස්තකාලය පිළිබඳ තොරතුරු අසා බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ ලක්දිවට වැඩම කළ බව සඳහන්වේ. පිරිසිදු බුදු දහම ලියූ පොත් මහා විහාර පිරිවෙනෙහි තිබුණ නිසයි බුද්ධඝෝෂ මාහිමියන් මෙහි පැමිණියේ. මහා විහාරයට දකුණු දෙසින් පිහිටි 'ග්‍රන්ථාකර පිරිවෙණ' උන්වහන්සේගේ වාසස්ථානය විය. එහි 'පධානඝර' නම් විශේෂ ප්‍රසාදයෙක සිට අටුවා පොත්ලියූ බව 'මහා වංශ' යෙහි සඳහන් වනුයේ මෙසේය:'

'අථ' යස්මා බුද්ධ ඝොසො ගහෙත්වා සබ්බ පොත්ථකෙ
තස්ස මහා විහාරස්ස දක්ඛිණාය පතිට්ඨිතෙ
පධාන ඝර නාමස්මිං පාසාදස්මිං වසං සුභෙ
මහා අට්ඨකථාදීනං තයං කත්වා සරීරකං.....'

මෙම පරිවෙනස්ථානයට 'ග්‍රන්ථාකර' යන නම ව්‍යවහාර වූයේද මෙහි බොහෝ පොත්ලියූ නිසාත්, පොත් තැන්පත් කර තිබුණ නිසාත්ය. 'මයුර පද' 'දක්ඛිණ සෙනෙවියා' 'ගලතුරුමූල' 'විජයබා' 'පද්මාවති' ආදී පිරිවෙන්ද මෙබඳු උසස් තත්ත්වයෙක විද්‍යාස්ථාන බව ඉතිහාසයෙන් පෙනේ.

<u>ධර්මාගාර</u>-

පොළොන්නරු පුර රාජධානි සමයේ විසූ රජවරුන් අතර ලෝක ශාසනෝපකාරී විවිධ කටයුතුවල නියැළුණු 5 වන කාශ්‍යප රජතුමා බුද්ධ ධර්මය පිළිබඳව ලියන ලද පොත් පමණක් තැබීම සඳහා විශේෂ පුස්තකාලයක් කළ බව සඳහන් වේ.

ඒ රජතුමා අභිධර්ම පිටකය රන්පත්වල ලියවීය. නුවර මැද ඉතා අලංකාර 'ධර්මාගාර' නම් ගොඩනැගිල්ලක් කරවා, එහි අභිධර්ම පිටකය ලියූ රන්පත් සහ වෙනත් බණ පොත් තබවා පූජා විධි හා අවුරුදු පතා පෙරහරද පැවැත්විය.

ක්‍රි.ව. 11 වැනි සියවසේ මැද භාගයේදී ලක්දිව එක්සත් කොට රජ පැමිණි මහා විජයබාහු රජතුමා ශාස්ත්‍රාභිවෘද්ධියට උපකාරී වන බොහෝ කටයුතු කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. ග්‍රන්ථ කර්තෘ

වරයන්ට ධනය දීමෙන්ද, නිත්දගම් පැවරීමෙන්ද ඔතුමා උපකාර කළේය. එපමණක්ද නොව, රජතුමා දිනපතා උදය කාලයේ පුස්තකාලයට ගොස් පොත් කියවූයේය. පොත් ලියුවේය. ධර්ම සංගණී ප්‍රකරණය එසේ දිනපතා පුස්තකාලයට ගොස් එතුමා ලියූ අගනා ග්‍රන්ථයකි.

විමසිය යුතු අදහස්

අපේ සිංහල රජ පරපුර දීප්තිමත් කළ ප්‍රධාන මාණික්‍ය හා සමාන විරෝදාර ගුණ සම්පන්න මහා පරාක්‍රමබාහු රජතුමා ශාස්ත්‍රාභිවෘද්ධිය සඳහා කළ බොහෝ කටයුතු අතර 'පුස්තකාල' පිහිටුවීම ද ඉතා වැදගත් කරුණක් සේ සැලකිය හැකිය. මහාවංශයේ 79 වැනි පරිච්ඡේදයේ 81 වන ගාථාවෙන් කියැවෙන පරිදි, මේ රජතුමා ලක්දිව ඒ ඒ තැන්හි පුස්තකාල 128 ක් කරවන ලදි. විහාරස්ථානවලට පමණක් සීමාවී පැවති පුස්තකාල පොදු මහජනයාගේද ප්‍රයෝජනය සඳහා මෙසේ නොයෙක් තැන්වල පිහිටුවන්නට ඇත.

මේ රජතුමාගේ මන්ත්‍රණ සභාවෙහි තිල දැරුවන් අතර දහම්ගෙයි නායක මහා මන්ත්‍රී නම් කෙනෙක්ද වීය. ධර්මාගාර යනු පෙර පුස්තකාලයනට ව්‍යවහාර වූ නමක් සේ පෙනේ. ඒ එසේ නම් මන්ත්‍රීවරයා පුස්තකාලයන් ... දහම් ගෙයි නායක - පිළිබඳ මහා භාරකාරත්වය ඉසිලූ කෙනෙක් සේ සිතන්ට ඉඩ තිබේ. විමැසිය යුතුයි.

පොළොන්නරුවේ කටබුන් අතර දක්නට ලැබෙන පොත්ගුල් විහාරයද පරාක්‍රමබාහු රජතුමා විසින් කරවන ලද්දකි. මෙය එකල ඉතා දියුණු තත්වයක තිබුණු පුස්තකාලයක් හා විහාරස්ථානයක් වන්නට ඇත. මහල් කීපයකින් යුක්තව තිබුණු ගොඩනැගිල්ලක සලකුණු දක්නට ලැබෙන මේ පුස්තකාලය, වටේට ඇති දීර්ඝ ශාලාව් පොත්ගුලට අවශ්‍ය තියවීම් ශාලාවක් ලෙස පිහිටා වූවක්දැයි විමසා බැලිය යුතුයි.

විනාශකාරී සමයක්

පරාක්‍රමබාහු රජතුමා සමයෙහි පැවති ශාස්ත්‍ර දියුණුව වැඩිකල් පවතින්නට ඉඩක් නොලැබීය. ක්‍රි.ව. 1213 දී කාලිංග විජයබාහු නමින් රජ පැමිණි 'මාඝ' නම් දුෂ්ඨ රජෙක් ලංකාව වනසා දැම්මේය. හෙතෙම ආගමික සිද්ධස්ථාන කඩා බිඳ දැම්මේය. සිංහලයන් තලා පෙලා නොයෙක් වධ දුන්නේය. ඔහුගේ භටයෝ මිනිසුන්ගේ වස්ත්‍රාභරණ පවා පැහැර ගනිමින් අශිෂ්ට ක්‍රියා කරමින් ගම් නියම්ගම්හි හැසුරුණාහ. මාර පිරිසක් වන ඔවුහු පුස්තකාලවලට වැදී ප්‍රසිද්ධ වැදගත් සිංහල පොත් ගෙන ලනුවෙන් මුදා තැන් තැන්වල විසුරුවා දැමූහ. මෙසින් විනාශ වූ පොත්පත් මෙතෙකැයි කිවනොහැකි තරම්ය. භික්ෂූන් වහන්සේලා විදේශවලට ගියහ., වනගත වූහ.

'සන්දමාලා', 'අසන්දමාලා' ආදි පෙර විසූ ශ්‍රේෂ්ඨ කවීන් ලියූ පොත් අද අප අතර ඇත්තේ නමින් පමණකි. මෙසේ නමින් පමණක් විද්‍යාමාන පොත් බැඩි හරියක් මාඝයන්ගේ කෲර භටයන්ගේ අතට අසුවීමෙන් විනාශ වන්නට ඇතැයි සිතිය හැකිය. මොවුන් අතට අසු නොවී ඉතිරි වුණු පොත්වලින්ද කොටසක් සීතාවක රාජධානි සමයෙහි රාජසිංහ රජුගේ අත්ට අසුවීමෙන් ගිනිබත් වන්නට ඇත.

මේ භයානක විනාශයන්ට අසුනොවී බේරුණු ග්‍රන්ථ ටිකෙකි අද අපට සිංහල සාහිත්‍යයක් ලෙස ලැබී ඇත්තේ. මේ ටික පවා ඉතිරි වූයේ භික්ෂූන් වහන්සේලා තමන්ට ගෙන යා හැකි තරම් ඔසවාගෙන වනගත වී, සතුරන් අතට අසුවන්නට නොදී දුක සේ රැක ගත් නිසාය. විනාශයට අසුවූ පොත් තිබුණේ නම්, කොතරම් උසස් සිංහල සාහිත්‍යයක් ඇතිවේදැයි සිතන විට පහළ වන්නේ බලවත් වේදනාවකි. විවිධ විෂයයන් පිළිබඳව දක්ෂ ලේඛකයන් ලියූ වැදගත් පැරණි සිංහල පොත්වලින් අපේ සාහිත්‍යය පෝෂණය වී තිබෙන්නට ඇති බව දැනට විද්‍යාමාන පැරණි පොත්වලින් මෙන්ම, කෞතුක වස්තූන්ගෙන්ද ඔප්පු වේ.

## පන්සල් පොත්ගුල්

පෙර මෙන් මෙකලද අපේ රටේ බොහෝ පන්සල්වල පොත්ගුල් තිබේ. මේවායින් සමහරක ඉතා අගනා පොත් තැන්පත් කර ඇත. බෞද්ධ මහජනයා ගේ උපකාරයෙන් ගොඩ නැංවුණු දර්ශනීය මන්දිර වල පිහිටුවා ඇති මේ පොත් ගුල්වලින් වැඩි හරියක් සුවඳ දුම් ඇල්ලීම සඳහාත්, තාවත්ගේ ආහාරය සඳහාත් සීමා වී තිබීම බලවත් ජාතික අපරාධයෙකි. අල්මාරිවල සුරකිව තබා ඇති මේ පොත් රටවැසියාගේ යහපත සඳහා නොයෙදී කාලයත් සමඟ විනාශ භාවයට වේගයෙන් ගමන් කරයි. පොත් තිබෙන්නේ කියවීම සඳහා නොව, දුම් අල්ලා සුරකිව තැන්පත් කර තැබීම සඳහාය යන මෝඩ අදහස් ඇති පුද්ගලයන් අතර අසුවී තිබෙනා තුරු මේ පුස්තකාල වලින් රටවැසියාට ප්‍රයෝජනයක් සලසා දීම ඉතා අපහසු කරුණක් වී තිබේ.

(පෞරාණ වජිරඥාණ හිමිපාණන් විසින් ළඟදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිත ග්‍රන්ථයෙනි. කර්තෘ හිමියන්ගේ කාරුණික අවසරයෙන් යුතුව පළ කරන ලද්දකි.)

## ශ්‍රී ලංකාවේ කළමනාකරණ සේවයේ නියුතු වූවන්ගේ නාමාවලියක්

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ලංකා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂකවරයාගේ සහාය ඇතිව රාජ්‍ය සංස්ථා සහ මණ්ඩල ඇතුළත් රාජ්‍ය අංශයේ සුදුසුකම් ලැබූ පුහුණු කළමනාකරණයේ නියුක්ත වූවන්ගේ නාමාවලියක් සකස් කරගෙන යනු ලැබේ.

මෙම නාමවලියේ නම්, අධ්‍යාපන සුදුසුකම්, පුහුණුව, ලැරැ තනතුරු, පළපුරුද්ද, විශේෂඥතාව, ලිපිනයන් ආදී මූලික තොරතුරු ඇතුළත් වන අතර, කළමනාකරත්ව ශිල්ප විද්‍යාවේ පිළිගත් විශේෂ අංශ යටතේ ඒවා සකස් කරනු ලැබේ.

කළමනාකරණ අංශයට සම්බන්ධ පුද්ගලයන් පිළිබඳ තොරතුරු සපයන්නක් ලෙස හැරුණු විට, මෙම නාමාවලිය විවිධ ක්ෂෙත්‍රවල දැනට සිටින කළමනාකාරිත්වය පිළිබඳ විශේෂඥයින්ගේ ප්‍රමාණය, විවිධ අංශවලට අවශ්‍ය ප්‍රමාණයක්, යම් අසමතුලිතයක් ඇති තැන් තිබේ නම් ඒ තත්වය නැති කිරීමට කුමන ආකාරයේ සැලසුම් කිරම සහ සංවිධානය කිරීම් අවශ්‍යද යන්නත් පෙන්වා දෙන සංඛ්‍යා ලේඛන තොරතුරු සොයා ගැනීමට උපකාරී වන්නක් ලෙසත් ක්‍රියා කරනු ලබයි.

---

## පුස්තකාල සේවා සේවක සුභසාධක සංගමයෙන් වාර්ෂික පුස්තකාල සඟරාවක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල සේවක සුභසාධක සංගමයේ වාර්ෂික සමරුව විශේෂ වාර්ෂික සඟරා කලාපයක් ලෙස 1978 මාර්තු මස නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

"සංවාද" නමින් හැඳින්වෙනු මෙම විශේෂ වාර්ෂික සඟරාව මඟින් පුස්තකාල ක්ෂෙත්‍රයේ සෑම අංශයකම පළපුරුද්දකම් ඇති ප්‍රවීනයන් හා පුස්තකාල විද්‍යාර්ථීන් අතර සංවාද ශීලි භාවයක් ඇති කිරීමත්, පොදු පාඨක ජනයා අතරද පුස්තකාල සේවාව ගැන හැඟීමක් දැනවීමටත් අරමුණු කර ඇති බව සේවක සුභසාධක සංගමය මඟින් පෙන්වා දෙනු ලැබ ඇත.

---

**'රන්ෆර්ලි' පොත් ආධාර :**

**පොත් 4051 ක් පුස්තකාල 53 කට සැපයේ**

---

1977 වර්ෂයේ අවසානය වන විට 'රන්ෆර්ලි' පොත් ආධාර වැඩ පිළිවෙල යටතේ ඉංග්‍රීසි බසින් පළව ඇති පොත් පිටපත් 4051 ක් මහජන පුස්තකාල 23 කටද, පාසල් පුස්තකාල 21 කටද, වෙනත් පුස්තකාල නවයක් අතරේද පුස්තකාල සේවා මණ්ඩලය මගින් බෙදා දෙනු ලැබ ඇත.

විවිධ ගණයේ ප්‍රබන්ධ කථා, විෂයාත්මක පොත් සහ ළමා පොත් මේ යටතේ බෙදා දී ඇත. මේවා අලුත්ම පොත් නොවනු නමුදු ශ්‍රී ලංකාවේ පුස්තකාලවල ඉංග්‍රීසි භාෂාමය පොත්වල අවශ්‍යතා සපුරාලීමට ඉවහල් වන බව පෙනී ගොස් තිබේ. එක්සත් රාජධානියේ පුස්තකාල අලුතින් මිල දී ගන්නා පොත්වලට සරිලන පැරණි පොත් තොගයක් නිති පතාම ඉවත් කරනු ලබන අතර, 'රන්ෆර්ලි' පොත් ආධාර වැඩ පිළිවෙල මගින් මේ ඒවා එකතු කොට ශ්‍රී ලංකාව වැනි රටවල පුස්තකාල අතර බෙදා හැරීම දැනට වසර කිහිපයක් පවත් කරගෙන එනු ලැබේ.

ඉදිරි වසර තුළදීද 'රන්ෆර්ලි' පොත් ආධාර ශ්‍රී ලංකාවට සැපයෙන අතර, මෙම පොත් බෙදා හැරීමේ සම්පූර්ණ හිමිකම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට හිමි වේ.

---

**බ්‍රිතාන්‍ය කවුන්සලයෙන්**

**ඉංජිනේරු විද්‍යා පොත් පරිත්‍යාගයක්**

---

බ්‍රිතාන්‍ය කවුන්සලය මගින් ලංකාවේ කාර්මික විද්‍යාල අතර භාවිතය සඳහා ඉංජිනේරු විද්‍යා පොත් පිටපත් දෙසිය පණහක් පසුගිය නොවැම්බර් මසදී පරිත්‍යාග කරන ලදී. ග්‍රන්ථ නාම පහකින් යුක්ත මෙම පොත් තොගය ලංකාවේ කාර්මික විද්‍යාලයන් අතර බෙදා හැරීමට පුස්තකාල සේවා මණ්ඩලය මගින් කටයුතු යොදාගෙන යනු ලැබේ.

මෙම පොත් පෙළ ශිෂ්‍යයන්ගේ භාවිතය සඳහා විශේෂයෙන් ප්‍රකාශයට පත් කරන ලද අලුත්ම පොත් තොගයකි.

---

ශ්‍රී ලංකාවේ පුවත්පත් පිළිබඳ

ග්‍රන්ථ නාමාවලියක් —

ශ්‍රී ලංකාවේ පුවත්පත් පිළිබඳ ප්‍රකාශනවල විස්තර නාමාවලියක් ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ පර්යේෂණ අංශය සකසා ගෙන යන බව වාර්තා වේ. පොත්පත්, ලිපි, පර්යේෂණ හා සම්මන්ත්‍රණ පත්‍රිකා, සඟරා හා පොත්, උපාධි සඳහා ලියන ලද නිබන්ධ ආදිය පිළිබඳව තොරතුරු අඩංගු මෙම නාමාවලියට භාෂා තුනෙන්ම පළවන ප්‍රකාශන ඇතුළත් වන බව ඒ පිළිබඳ නිකුත් කර ඇති පුවත්පත් නිවේදනයේ සඳහන් වේ.

ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ලේකම් සරත් අමුණුගම මහතා විසින් නිකුත් කර ඇති එම නිවේදනය පරිදි, එම විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රකාශන ප්‍රසිද්ධ කරවා ඇති සියල්ලන්ගෙන්ම කොළඹ 1, තැ.පෙ. 1416, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ පිහිටි ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ලේකම් වෙත පහත සඳහන් විස්තර 1977 දෙසැම්බර් මස 31 වන දිනට පෙර එවන ලෙස ඉල්වා සිටිනු ලැබ ඇත:

1. පොත්පත්වල හෝ පත්‍රිකාවල නම් හා ප්‍රකාශනවල විස්තර
2. කර්තෘගේ නම් පදවි නාමය හා ලිපිනය
3. ප්‍රකාශනය පිළිබඳ ලුහුඬු විස්තරයක් හෝ ප්‍රකාශනයේ පිටපතක්

මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක: 29964 ට අමතන ලෙස ඒ පිළිබඳ නිවේදනයේ දක්වා ඇත.

(දිනමිණ - 77.12.01)

---

මර්සලින් ජයකොඩි පියතුමාට

පූජකවරය ලැබ් පනස් වසර සපිරේ

---

ප්‍රකට ලේඛකයකු, සංගීතඥයකු, පුවත් ගත් කතුවරයෙකු හා වියත් ලේඛකයෙකු වන මර්සලින් ජියකොඩි පියතුමා පූජකවරය ලබා පනස් වසරක් පිරීම නිමිත්තෙන් කැළණිය පිලුපිටිය සාන්තා ආනා දේවස්ථානයේදී කැළණි මිසම් පාලක රිචඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුම —න්ගේ මූලිකත්වයෙන් ආසිරි පැතීමේ දේව මෙහෙයක් පැවැත්විණි.

---

## දෙහිවල - ගල්කිස්ස මහජන පුස්තකාල ප්‍රණාලිය

ප්‍රධාන පුස්තකාලාධිපති
එම්.ඩී.එච්.ජයවර්ධන
විසිනි.

මහජන පුස්තකාල සේවය පිළිබඳව නව පිබිදීමක් ඇති වූ මෙම වකවානුවෙහි දෙහිවල - ගල්කිස්ස නාගරික ප්‍රදේශයේ මහජන පුස්තකාල සේවාව පිළිබඳව තොරතුරු ඇතුළත් විස්තරයක් ඉදිරිපත් කිරීම කාලෝචිතයයි සිතමි.

දෙහිවල-ගල්කිස්ස නාගරිකය ලංකාවේ පළාත් පාලන ආයතන අතුරින් දෙවැනි වැදගත් පළාත් පාලන ආයතනය ලෙස හැඳින්විය හැක. මෙම පළාත් පාලන බල ප්‍රදේශයේ මේ වනතුරු පැවති පුස්තකාල සේවය සංවිධානාත්මක වූමක් නොවිය. පුස්තකාල සේවය පැවතුණේ ඉතාමත් කොදියුණු තත්ත්වයකය. මෙම ප්‍රදේශයේ බුද්ධිමත් ජනතාවගේ කියවීමේ පිපාසය සංසිඳවීමට පැවති පුස්තකාල සේවය කිසිසේත් ප්‍රමාණවත් නොවිය. මේ නිසා අගනුවර පුස්තකාලවලට තම කියවීමේ පහසුකම් ලබා ගැනීමට මෙම ප්‍රදේශයේ පාඨක පිරිස එක් රොක් වූ බව පැහැදිලිය.

1977 මැයි මස 16 වැනි දින ජනාධිපති විලියම් ගොපල්ලව උතුමාණන් විසින් විවෘත වූ ප්‍රේෂර් මාවතේ මධ්‍ය පුස්තකාලය මෙම ප්‍රදේශයේ ජනතාවගේ කියවීමේ පහසුකම් ඇති කොට ප්‍රදේශයේ ඇති පුස්තකාල සේවය විධිමත් කිරීමේ අරමුණින් ආරම්භ වූවකි.

මහජන පුස්තකාලය හා සමාජය අතර ඇති සම්බන්ධය ඉතාමත් සමීප සම්බන්ධයකි. සමාජයේ සෑම අංශයකම සංවර්ධනය කෙරෙහි පුස්තකාල සේවය නිහඬ බලපෑමක් කර ඇති බව කවුරුත් පිළිගත් නා කරුණකි. මේ නිසා පුස්තකාලයත් සමාජයත් අතර පවතිනේ බලවත් බැඳීමකි. එනිසා දෙහිවල ගල්කිස්ස ප්‍රදේශයේ පුස්තකාල සේවය ගැන යමක් පැවසීමට පළමු මෙම ප්‍රදේශයේ සමාජික, ආර්ථික පසුබිම පිළිබඳව සුළු වශයෙන් හෝ හැඳින්වීමක් අවශ්‍යය.

### දෙහිවල - ගල්කිස්ස නාගරික ප්‍රදේශය

ජනගහණය අනුව බලන විට මෙම නාගරිකය ලංකාවේ වැඩි ජනගහණයක් ඇති දෙවන නගරය ලෙස හැඳින්විය හැක. 1921 දී මෙම ප්‍රදේශයේ ජනගහණය 25,341 ක් වූ අතර, 1974 දී ජනගහණය 1,62,000 ක් විය. ප්‍රදේශයේ ජනගහණය වැඩිවීමේ සීඝ්‍රතාවය මේ අනුව පැහැදිලි වේ. එමෙන්ම, මෙම ජනගහණය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ ආදී විවිධ ජන කොටස් වලින් සංයුක්ත වන බව සැලකිය යුතුයි. මෙම නාගරික ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග සැතපුම් 6 1/3 ක් පමණ වේ.

සත්ව උද්‍යානය, ගල්කිස්ස හෝටලය, දකුණු කොළඹ මහ රෝහල සහ රත්මලාන ගුවන් තොටුපළ වැනි වැදගත් ස්ථානයන් මෙන්ම, බෞද්ධ, හින්දු හා මුස්ලිම් ආගමික ස්ථානද, තරුණ බෞද්ධ සමිති, තරුණ ක්‍රිස්තියානි සමිති වැනි සංවිධානයන්ද ශාන්ත තෝමස් විද්‍යාලය, දෙහිවල මධ්‍ය මහා විද්‍යාලය, කළුබෝවිල බුද්ධ ඝෝෂ විද්‍යාලයද, ශාන්ත මේරිස් විද්‍යාලය ඇතුළු වැදගත් විද්‍යාලයන්ද රජයේ බහුතාක්ෂණික ආයතනයද පිහිටා ඇත.

මේ හැර රජයේ දුම්රිය වැඩපල, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සහ යන්ත්‍රෝපකරණ දෙපාර්තමේන්තු විශාල කර්මාන්තශාලා පිහිටා ඇත්තේ මෙම නාගරිකය තුළය.

මීට අමතරව, නොයෙකුත් වෙළඳ සමාගම් මගින් පාලනය වන රෙදිපිලි, සපත්තු, සුවඳවිලවුන් බිස්කට්, බෙහෙත් ද්‍රව්‍ය ආදී නිෂ්පාදන ආයතන රාශියක්ද මෙහි පිහිටා ඇත. රත්මලාන ප්‍රදේශය කර්මාන්ත පුරවරයක් බඳු යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.

අතීතය දෙස බලන විට, මෙම ප්‍රදේශය වැඩි වශයෙන් හැඳින්වූයේ ධීවර ගම්මානයක් ලෙසය. අද වුවද ධීවර කටයුතු ජීවනෝපාය කර ගත් ජන කොටස් සෑහෙන පිරිසක් මෙම ප්‍රදේශය තුළ වෙසෙති.

මෙම ප්‍රදේශයේ මහජන පුස්තකාල සේවය ගැන සිත යොමු කිරීමට පළමුව ඉහතින් සඳහන් කළ සමාජ, ආර්ථික පසුබිම ගැන අපගේ අවධානය යොමු විය යුතුය. නූතන සමාජයේ දේශපාලන, ආර්ථික, සාමාජික වශයෙන් වූ සෑම අභිවෘද්ධියකදීම මහජන පුස්තකාලය මගින් ඉටු කර ඇති සේවය ඉමහත්ය. අංග සම්පූර්ණ පුස්තකාල සේවයක් නොමැති නාගරික ප්‍රදේශය දියුණු නාගරික ප්‍රදේශයක් වශයෙන් හැඳින්වීම අපහසුය.

මධ්‍ය පුස්තකාලයක පිහිටුවීමේදී අනෙකුත් ශාඛාවන්ට බාධාවක් නොවන ලෙසදී, කටයුතු කළ අතර, එකදු ශාඛා පුස්තකාලයක් වත් වසා තැබීමට කටයුතු නොකරන ලදී. සාමාන්‍යයෙන් අලුතින් පිහිටුවන විශාල පුස්තකාලයක මූලික ග්‍රන්ථ එකතුව සඳහා පැරණි පුස්තකාලයක ග්‍රන්ථ සම්භාරය පවරා ගනී. උදාහරණයක් වශයෙන් කොළඹ මහජන පුස්තකාලයේ ආරම්භයද එසේ විය. දෙහිවල මධ්‍ය පුස්තකාලය සඳහා එවැනි පොත් සමූහයක් නොතිබී අතර, තම උත්සාහයෙන්ම ග්‍රන්ථ සම්භාරය දියුණු කිරීමට සිදුවිය නමුත් මෙහි ඇති වැදගත් කරුණ වූයේ අද්‍යතන පාඨකයනට අවශ්‍ය අලුත් පොත්පත ලබාදීමේ ඉඩකඩ ඇතිවීමය.

අභිනව මධ්‍ය පුස්තකාලයේ එක් එක් අංශ පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මෙහි පහත දැක්වේ.

කියවීම් ශාලාව
----------

පුස්තකාලයට සමීපවන දොරටුවට තුදුරුව මෙය වම්පස පිහිටා ඇත. මෙම අංශයෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ පාඨකයනට පුවත්පත් සගරා සැපයීමෙන් කියවීමේ පහසුකම් සැලසීමයි. මෙම අංශයේ පාඨකයන්ගේ තදබදය වැඩිවීම නිසා ඉහළ මෑතක සිට පුවත්පත් සඳහා පමණක් කියවීම් ශාලාව සීමා කරන ලදී. දිනපතා විශාල පාඨක පිරිසක් මෙම අංශයට ඇදී එති. සිංහල, දෙමළ, ඉංග්‍රීසි වශයෙන් පුවත් පත් නාමයන් විසිපහක් පමණ සංඛ්‍යාවක් පාඨකයන් සඳහා සපයනු ලැබේ. එක්වර පාඨකයන් 75 කට පමණ ප්‍රයෝජන ගත හැකි අතර, මෙහි වර්ග ප්‍රමාණය වර්ග අඩි, 810 ක් වේ.

ළමා අංශය
--------

නූතන පුස්තකාල ක්‍රමයක බාල පරපුර සඳහා විශේෂ තැනක් දීම අනිවාර්යයෙන් කළ යුතු දෙයක් බවට පත්ව ඇත. බාල පරම්පරාව ජාතියේ කොඳු නාරටිය ලෙස හැඳින්විය හැක. ළමයින් සඳහා ලංකාවේ වෙනම පුස්තකාල ඇත්තේ ඉතා අතලොස්සකි. දෙහිවල - ගල්කිස්ස නාගරික ප්‍රදේශයේ ළමයින් සඳහා වෙන්වූ කිසිම පුස්තකාලයක් මීට පෙර නොතිබුණ බවද සත්‍යයකි. අභිනව මධ්‍ය පුස්තකාලයේ

මේ නිසා ළමා අංශය වැදගත් ස්ථානයක් ගෙන ඇත. බිම් මාලයෙහි පුස්තකාලයට ඇතුළුවන ස්ථානයේම කියවීම් අංශයට මුහුණ ලා දකුණත පැත්තේ ළමා අංශය පිහිටා ඇත. මෙහි එක්වර ළමුන් 30 කට පමණ කියවීමට පහසුකම් සලසා ඇත. දැනට ලියාපදිංචි වී ඇති ළමා පාඨකයින් ප්‍රමාණය 160 ක් පමණ වේ. ළමුනට ගැළපෙන ලී බඩුවලින්, විචිත්‍ර ආදියෙන් සැළසුම් ලද මෙම අංශය සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් පළවූ ළමා පොත් විශාල සංඛ්‍යාවක් මිලදී ගෙන ඇත.

ළමා අංශය විවෘතව ඇති වේලාවන්:
සතියේ දිනවල - පෙ.ව.10.45 සිට ප.ව.6.00 දක්වා
සෙනසුරාදා දිනයන්හි සහ
පාසල් නිවාඩු දිනයන්හි - පෙ.ව. 9.00 සිට ප.ව.5.00 දක්වා

වයස අවුරුදු 14 ට අඩු, නාගරික ප්‍රදේශයේ පදිංචිය ඇති හෝ ඉගෙනුම ලබන ළමුනට මෙම අංශයට සාමාජිකයින් ලෙස බඳවා ගනු ලැබේ.

ළමා කථා පැය, චිත්‍ර තරග, කඩදාසි නැමීම ආදී විනෝදාංශ වැඩ සටහන් මෙම අංශයේ අතිරේක වැඩසටහන් ලෙස ළමා පාඨකයන්ට ලබා දෙනු ලැබේ. ළමා අංශයේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 540 කි. මෙම අංශයෙහි තුඩුරින් හිස් භූමි භාගයෙහි අලංකාර මසුන් සහ මල්වලින් පිරුණු පොකුණ කුඩා ළමුන්ගේ සිත් කාවදින ස්ථානයක් බවට පත්ව ඇත.

වාර සඟරා අංශය

බිම් මහලෙහි පිටුපස ගොඩනැගිල්ලේ දකුණු පස පිහිටා ඇති මෙම ශාලාවේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 782 කි. මෙම අංශයෙහි එක්වර පාඨකයන් 75 කට පමණ කියවීමට පහසුකම් සපයා ඇත. නාම යන් 80 ක පමණ වාර සඟරා පාඨකයන් සඳහා තබා ඇත.

බැහැර දෙන අංශය

උඩුමහලෙහි පිටුපස දිග ශාලාව මේ සඳහා වෙන්කර ඇති අතර, මෙහි වර්ග ප්‍රමාණය වර්ග අඩි 1620 ක් වේ. සිංහල, දෙමළ, ඉංග්‍රීසි වශයෙන් පොත් විශාල ප්‍රමාණයක් ඇති මෙම අංශයෙහි පොත් වර්ග කර ඇත්තේ ඩිවි දශම ක්‍රමයේ 18 වන සංස්කරණය අනුවය. පොත් පත් තෝරාගැනීම පහසුව සඳහා සුවියක්ද පවත්වාගෙන යනු ලැබේ. නාගරිකය තුළ පදිංචිය හෝ සේවා ස්ථානය ඇති ඕනෑම කෙනෙකුට රුපියල් 5.00 ක වාර්ෂික ගාස්තුවක් ගෙවීමෙන් මෙහි සාමාජිකත්වය ලබා ගත හැක. ඇපකරුවන් දෙදෙනකුගේ සහතිකයක්ද ඊට අවශ්‍යය. පසුගිය ජූනි මාසයේදී ආරම්භ කරන ලද මෙම අංශයෙහි ප්‍රගතිය ප්‍රකාශනය වන අතර, එහි ලියාපදිංචි සාමාජික සංඛ්‍යාව 200 ඉක්මවා ඇත.

විමර්ශන අංශය සහ ශ්‍රී ලංකා අංශය

ගොඩනැගිල්ලේ පළමු මහලේ මුල් කොටසේ දකුණු පස ඇති බිම් ප්‍රමාණය මේ සඳහා තෝරා ගෙන ඇත. පුස්තකාලයේ ජනප්‍රිය අංශයක් ලෙස මෙම අංශය හැඳින්විය හැක. මෙම අංශයෙහි පාඨක යන් 75 කට පමණ එකවර ප්‍රයෝජන ගත හැක. මෙහි ශාලාවේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 810 කි. මෙම අංශයෙහි ශ්‍රී ලංකා ප්‍රකාශන සඳහා වෙනම කොටසක් ඇත. දෙහිවල ගල්කිස්ස ප්‍රදේශයට ප්‍රයෝජන

වත් වන ග්‍රන්ථ, ලියවිලි, පුස්තිකා ආදිය හැකි තරම් දුරට එක් තැන් කොට විශේෂ පාඨක සේවයක් සැපයීමට උත්සාහ කරනු ලැබේ.

## මධ්‍ය පුස්තකාල කාර්ය මණ්ඩලය

ප්‍රධාන පුස්තකාලයාධිපති වශයෙන් පලාත් පාලන සේවයේ පළමුවන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු සේවය කරන අතර, ඔහුට සහායට දෙවන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකුද, තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතීන් දෙදෙනකුද සිටිති. මින් එක් අයකු ද්‍රවිඩ අංශය සඳහා වේ. මේ හැර ඒ ඒ අංශවල සේවය සඳහා පලාත් පාලන නොවන පුස්තකාල සහායක්යින් අටදෙනෙකු සිටිති. සුළු සේවකයින්ද සමඟ පුස්තකාල කාර්ය මණ්ඩලය 22 ක් වේ.

## ශාඛා පුස්තකාල සහ කියවීම් ශාලා.

දෙහිවල ගල්කිස්ස නාගරික සීමාව තුල ශාඛා පුස්තකාල දෙකක්ද, කියවීම් ශාලා දෙකක්ද, පිහිටා ඇත. මෙම කියවීම් ශාලා දෙකෙහිද පොත් බැහැරදීමේ සේවාවන් පවත්වනු ලැබේ.

## කරගම්පිටිය ශාඛා පුස්තකාලය

මධ්‍ය පුස්තකාලයට සැතපුම් එකහමාරක පමණ දුරින් කරගම්පිටිය බස් නැවතුම් පොළ අසල මෙය පිහිටා ඇත. 1962 පෙබරවාරි මස 16 වැනි දින ආරම්භ කරන ලද මෙම පුස්තකාලය, දෙහිවල ගල්කිස්ස පුස්තකාල ප්‍රණාලියේ පැරණිම පුස්තකාලය වශයෙන් සැලකිය හැක. සිංහල, ඉංග්‍රීසි, දෙමළ වශයෙන් පොත් 3500 ක් පමණ මෙම පුස්තකාලයෙහි ඇත. දිනපතා හා සතිපතා පුවත්පත් හා වාරසඟරා සැපයීමෙන් කියවීමට පහසුකම් සලසා ඇති අතර, එහි ලියාපදිංචි සංඛ්‍යාව 675 කි. මෙම ශාඛා පුස්තකාලය භාරව තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු සේවය කරන අතර, පුස්තකාලය භාරකාරවරයෙකු සහ ඕඩර්ලිවරයෙකුද ඔහුගේ සහායට වෙති.

## ගල්කිස්ස ශාඛා පුස්තකාලය

ගල්කිස්ස මංසන්ධියේ මෙය පිහිටා ඇත. මෙම ශාඛාවෙහි ලියාපදිංචි සාමාජික සංඛ්‍යාව 340 කි. පුවත්පත්, වාරසඟරා කියවීමේ පහසුකම් සලසා ඇත. මධ්‍ය පුස්තකාලයේ සිට මෙම ශාඛාවට ඇති දුර ප්‍රමාණය සැතපුම් දෙකහමාරක් පමණ වේ. පොත් සංඛ්‍යාව 3300 ක් පමණ වෙයි. මෙහි සේවය සඳහා තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකුද, ඔහුගේ සහායට පුස්තකාල භාරකරුවෙකුද, ඕඩර්ලිවරයෙකුද නගර සභාවෙන් පත් කර ඇත.

## අත්තිඩිය කියවීම් ශාලාව

දෙහිවල ගල්කිස්ස නාගරිකයෙහි පිහිටි පැරණිම කියවීම් ශාලාව වශයෙන් මෙය හැඳින්විය හැක. ආරම්භ වූයේ 1969 ජනවාරි මස 09 වන දින පටන්ය. මෙම කියවීම් ශාලාව ආරම්භ කිරීමේ

අරමුණ වූයේ පුවත්පත් සහ සඟරා සපයා පාඨකයන්ට කියවීමේ පහසුකම් සැලසීම වුවද, පොත් බැහැර දීමේ අංශයක්ද මෑතක සිට පවත්වාගෙන යනු ලැබේ. බැහැරදීම සඳහා ඇති පොත් සංඛ්‍යාව 800 ක් පමණ වේ. බැහැර දීම සඳහා නගර සභාවෙන් පත්කළ පුස්තකාල භාරකරුවෙකුද, ඕඩර්ලි වරයෙකුද යොදා ඇත. මධ්‍ය පුස්තකාලයේ සිට අත්තිඩිය කියවීම් ශාලාවට සැතපුම් හතරක පමණ දුර ප්‍රමාණයක් ඇති බැවින් දුර බැහැර සිටින මධ්‍ය පුස්තකාලයට පැමිණෙන අපහසු පාඨකයනට මේ නිසා මහඟු සේවයක් සැලසේ.

## සරණංකර කියවීම් ශාලාව

අභිනව මධ්‍ය පුස්තකාලයට ඉතා සමීපව පිහිටා ඇති මෙම කියවීම් ශාලාව ආරම්භ වූයේ 1971 වර්ෂයේදීය. පොත් බැහැරදීම මේ මෑතකදී සිට ඒ මගින් ආරම්භ කර ඇති අතර, පුස්තකාලය සතුව ඇති පොත් සංඛ්‍යාව 700 ක් පමණ වේ. ලියාපදිංචි සාමාජික සංඛ්‍යාව 65 කි. නගර සභාවෙන් පත් කළ පුස්තකාල භාරකරුවෙක්ද, ඕඩර්ලිවරයෙකුද මෙහි සේවය සඳහා යොදවා ඇත.

## අභිනව මධ්‍ය පුස්තකාලය පිහිටුවීමේ අරමුණ

දෙහිවල ගල්කිස්ස නාගරිකය තුල දැනට පවතින පුස්තකාල සේවය සංවිධානය කිරීමත්, ප්‍රදේශයේ ජනතාවගේ කියවීමේ පිපාසය සංසිඳවීමට අවශ්‍ය සෑම පහසුවක්ම සැලසීමත් පුස්තකාලය සේවය ජනතාව අතර තව තවත් ව්‍යාප්ත කිරීමත් අපගේ අරමුණ විය.

## මධ්‍ය පුස්තකාලය සඳහා ලැබුණ ආධාර

පොදු මහජනතාවගේ මෙන්ම, නොයෙකුත් සමිති සමාගම්වලින්ද පොත් පත් සහ විළ මුදල් අප වෙත ලැබුණ අතර, පුස්තකාල සේවය සඳහා මහජන ආධාර මෙපමණ මහත් කළ එකම පලාත් පාලන ආයතනය වීමට කොතෙකුත් ඉඩ ඇත්තේ අප වෙත ලැබුණ ආධාර ප්‍රමාණය දෙස බලන විටය.

නොයෙකුත් සමිති සමාගම්, කර්මාන්ත ආයතන සහ පුද්ගලයන්ගේත් ආධාර ලබා ගැනීමට අප සමත්වූ අතර, රුපියල් 48,000/- ක පමණ ආධාර මුදලක් අප වෙත ලැබුනි.

මෙම පුස්තකාල අරමුදල් තර කර ගැනීමේ ව්‍යාපාරයේදීහි ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් ලද අනුග්‍රහය විශේෂයෙන් සඳහන් කළ යුතුය. පුස්තකාල සේවා මණ්ඩලය වෙත සලසා තිබ යෙදී ඇති ඇත්තාවූ බදු සහන ක්‍රමය යටතේ (ලිපියේ අග සටහන බලන්න) මේ මුදල රැස්කර ගැනීමට සමත්වූ අතර, තව තවත් ආධාර ලැබෙමින් පවතී.

මෙම ආධාර එකතු කිරීම සඳහා වැල්ලවත්ත සිංහ සමාජය විසින් නොමසුරු සහයෝගය දෙන ලදී.

මේ හැර ගල්කිස්ස රොටරි සමාජය මධ්‍ය පුස්තකාලය සඳහා පොත්පත් සපයා දීමෙන් විශාල

සහයෝගයක් දී ඇත. මේ අනුව, ඇමෙරිකාවේ ස්කොට්වැලි රොටරි සමාජය මගින් ඉතා වටිනා පොත් කීපයක් අප වෙත ලැබුණි. රොටරි සමාජය මගින් අප වෙත ජංගම පුස්තකාල රථයක් ලබා දීමටද පියවර ගනු ලැබේ.

සුප්‍රසිද්ධ සමාජසේවකයකු වන ඇමෙරිකාවේ පදිංචි දොස්තර බුද්ධදාස කීර්තිසිංහ මහතා දැනටමත් අප වෙත ඇමෙරිකා ඩොලර් දහසක පරිත්‍යාගයක් කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය පොත් පත් ලබා ගැනීමට පොත් ලැයිස්තුවක් ඔහු වෙත යවා ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින්ද 'රත්ඵරිලි' පොත් ආධාර වැඩපිළිවෙල යටතේ ඉංග්‍රීසි බසින් පළවූ ඇති අගනා පොත් කට්ටලයක්ද ප්‍රදානය කරන්නට යෙදුණු බව මෙහිලා සඳහන් කල යුතුවේ.

1977 දෙසැම්බර් මසදී අප විසින් 'ඇමෙරිකානු – කැනේඩියානු කියවීම් ශාලාව' යනුමවින් මධ්‍ය පුස්තකාලයේ එක් කාමරයක් නම් කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා විධි විධාන සකසා ගෙන යනු ලැබේ. මෙමගින් අප වෙත සෑහෙන විදෙස් ආධාර ලැබෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

මේ හැර ඇමෙරිකානු තානාපති කාර්යාලය, බ්‍රිතාන්‍ය මණ්ඩලය ආදී තානාපති සේවා මගින්ද පොත් පත් පරිත්‍යාග කිහිප විටකදී ලැබුණි.

පුස්තකාලය සංවිධානය පිළිබඳව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලසේවා මණ්ඩලයේ සහායද, කොළඹ මහජන පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපතිනිය වන ඊශ්වරී කොරෙයා මෙනවියගේ සහයෝගයද අප වෙත ලැබුණි.

## මතු අපේක්ෂාවන්

මධ්‍ය පුස්තකාල ගොඩනැගිල්ල තවත් විශාල කොට සිතුවම් ශාලාවක්, රැස්වීම් ශාලාවක් තැනීමට අදහස් කරන අතර; ඉමමගින් තවත් අමතර පාඨක සේවාවක් සැලසීමට අදහස් කරනු ලැබේ. මේ හැර ප්‍රදේශය තුල මධ්‍ය පුස්තකාලය වෙත පැමිණීමට අපහසු දුර බැහැර පදිංචි ජන කොටස් සඳහා ජංගම පුස්තකාල සේවයක් සැලසීමට අදහස් කර ඇත. අපට මෙතෙක් ලැබුණු මහජන සහයෝගය දෙස බලන විට නුදුරු අනාගතයේදීම ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කොතෙකුත් ඉඩ ඇති බව අපගේ විශ්වාසයයි.

---

සටහන: මුදල් අමාත්‍යවරයා විසින් 1973 අංක: 4 දරණ දේශීය ආදායම් පණතේ 16(අ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් බවට ප්‍රකාශයට පත් කර ඇත. මෙවැනි පිළිගත් ආයතන. යක අභිවෘද්ධිය හා කටයුතු පිණිස සිය ධනයෙන් හා දේපලවලින් යම් පරිත්‍යාගයන් කරන තැන්නැත්තකුට දේශීය ආදායම් බදු සහන පනත යටතේ සහන සැලසේ.

1970 අංක: 17 දරණ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතේ 14 වන වගන්තිය ප්‍රකාර පැවරී ඇති කටයුතු අතරින් කැමති කටයුත්තක් සඳහා මෙම ආධාර යෙදවිය හැකිය.

–සංස්කාරක

## ප්‍රකාශන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

මගින්

ප්‍රකාශිත පොතපත

* <u>මහජන පුස්තකාල ප්‍රමිති</u>

  සංස්කරණය:

  ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

  මිල රු. 4.00

* <u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය</u>

  වාර්ෂික දායක මුදල - රු. 45.00 (තැ.ගා.සමග)

* <u>පුස්තකාල ප්‍රවෘත්ති</u>

  සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රයෙන්

  ත්‍රෛමාසික ප්‍රකාශනය - නොමිලයේ සැපයේ

* Catalogue of Postgraduate dissertations in the Libraries of Sri Lanka
  Comp. by N. Amarasinghe (Unpriced)

<u>ලියුම්, මුදල් ඇණවුම් හෝ චෙක්පත් පහත ලිපිනයට:</u>

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
72, බෞද්ධාලෝක මාවත, කොළඹ 4. ටෙලි: 82243

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/13
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ............

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ............

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*